**ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය නොකළ මතය**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 2 මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 දෙසැම්බර් මාසයේදී අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර තිබූ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සඳහා නිර්දේශ ඇතුළත් වාර්තාව අනුව කලින් කල ප්‍රකාශයට පත් කෙරෙන ප්‍රතිපත්ති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් ජාතික හා පළාත් මට්ටමින් පැවැත්වීමට සැලැසුම් කර තිබුණි. නමුත් ඉන් වැඩසටහන් 5 ක් පමණක් පවත්වා තිබුණි. | සැලැසුම් කළ පරිදි කටයුතු ඉටුකළ යුතු විය. | 2017 වර්ෂයේ දෙසැම්බර් මස අතිගරු ජනාධිපතිතුමා වෙත සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පිළිගැන්වුවද එය මේ වන තෙක් ජාතික ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත් කර නොමැති වීම හේතුවෙන් සැලසුම් කළ පරිදි අදාළ ජාතික හෝ පළාත් මට්ටමේ දැනුම්වත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීමට අවස්ථාවක් නොලැබුණු බව. |
| (ආ) | උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය සඳහා රු.5,220,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.4,656,645 ක් උපයෝජනය කර තිබුණි. ප්‍රතිපත්ති සඳහා නිර්දේශයන් ඇතුළත් පර්යේෂණ වාර්තාව 2019 මැයි 10 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | සැලසුම් පරිදි කටයුතු කළ යුතුය. | උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා මාලාවක් සකස් කිරීමට අදාල පර්යේෂණ අධ්‍යයනයන් අට **(8)** පදනම්ව අවසන් වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම අධ්‍යයන වාර්තා ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය නොවන බැවින් ද ඒවා පදනම් කරගෙන අවසන් ප්‍රතිපත්ති වාර්තාව සකස් කරන බැවින් ද එම අවසන් වාර්තාව භාෂාත්‍රයෙන්ම පළ කිරීමට කටයුතු කරන හෙයින් ද පර්යේෂණ අධ්‍යයනයන් අටෙහි වාර්තා භාෂාත්‍රයෙන් මුද්‍රණය නොකරන ලදී. |

### 2.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු විය. | මෙම ආයතනයට අදාල 2014, 2015, 2016 වර්ෂයන්හි කාර්යසාධන හා පාලන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා 2019.02.13 දිනැතිව ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී. එහෙත්, එම අවස්ථාව වන විට |

| | |
|---|---|
| යුතු වුවත්, 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ වාර්තා, කොමිෂන් සභාව විසින් 2019 මැයි 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2017 වර්ෂයට අදාළ විගණන වාර්තාව ලැබී නොතිබීම හේතුවෙන් 2017 වර්ෂයේ කාර්යසාධන වාර්තාව හා පාලන වාර්තාව එදින ඉදිරිපත් කිරීමට නොහැකිවූ බව. |

**2.3 ප්‍රසම්පාදනයන්**

----------------

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | --------------- | ------------------ |
| (අ) | 2018 වර්ෂයට අදාළ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට අනුව ඇස්තමේන්තුගත ප්‍රසම්පාදන වටිනාකම රු.1,327,000 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රසම්පාදනයන් ප්‍රකාර රු.802,772 ක් වැය කර තිබුණි. නමුත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ආ) සහ (ඇ) මාර්ගෝපදේශයන්ට අනුකූල වන පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතුය. | 2019 වර්ෂයේ දී සිදුකරනු ලබන බව |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1(අ) සහ (ආ) මාර්ගෝපදේශයන්ට අනුකූල වන පරිදි සම්මත ලංසු ලේඛන භාවිතා කර නොතිබුණි. | -එම- | -එම - |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික අගැයීම් කමිටු රැස්වීම් වාර්තා සටහන් සහ ප්‍රසම්පාදන කමිටු රැස්වීම්වල වාර්තා පවත්වාගෙන නොතිබුණි. | -එම- | -එම - |

**3 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | -------------------------------- |
| (අ) | පුරප්පාඩු වී ඇති ගණකාධිකාරී තනතුර සඳහා නිලධාරියකු බඳවා ගැනීම සඳහා 2019 මැයි 10 දින වන විට අයදුම්පත් කැඳවා තිබුණද සම්මුඛ පරීක්ෂණය පවත්වා නොතිබුණි. | කොමිෂන් සභාවේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය විධිවිධාන සැලැස්විය යුතුය. | අනුමත වී ඇති ගණකාධිකාරී තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා කැඳවන ලද අයදුම්පත් අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉදිරි කටයුතු සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී තනතුරු දෙකක් අනුමත කර තිබුණද 2019 මැයි 10 දින වන විට නිලධාරීන් බඳවාගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. ඊට අමතරව අනුමත වී ඇති තවත් තනතුරු 11 ක් පුරප්පාඩුව පැවතුණි | -එම- | පුරප්පාඩු වී ඇති සියළු තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. තවද, ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරීවරයකු හා සංවර්ධන නිලධාරීන් 02 ක් බඳවාගැනීම සඳහා 2019.04.02 දිනැතිව පුවත්පත් දැන්වීමක් පළකරන ලදුව ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී තනතුර සඳහා ලද අයදුම්පත් අතුරින් සුදුසුකම් අනුව අයදුම්කරුවන් දෙදෙනෙකු සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද බව හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අනුව එක් නිලධාරියකු බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමට මේ වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. |